(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 22.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 අගෝස්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0071/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් පසුගිය වර්ෂ 02 තුළ නිකුත් කරන ලද සියලුම ගුවන් විදුලි සංඛ්‍යාත (සංඛ්‍යාත පරාසය) පිළිබඳ විස්තර එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගුවන් විදුලි සංඛ්‍යාත (සංඛ්‍යාත පරාසය) නිකුත් කරන ලද්දේ රාජ්‍ය දේපළ නිකුත් කිරීම සඳහා නියම කොට ඇති රජයේ ටෙන්ඩර් පටිපාටිවලට අනුකූලවද;

(ii) එක් එක් ගුවන් විදුලි සංඛ්‍යාතය (සංඛ්‍යාත පරාසය) ප්‍රදානය කිරීමෙන් උපයා ගත් ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0178/'09

2.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අපේ රටේ පවත්නා ක්‍රීඩා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් වෙන් වෙන් වශයෙන් අයත්වන්නේ පළාත් සභාවලටද නොඑසේ නම්, මධ්‍යම රජයට ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් දිස්ත්‍රික්කය අනුව අදාළ පාසල්වල නාමලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මෙම "ක්‍රීඩා පාසල්" සංවර්ධනය සඳහා විශේෂිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) නොඑසේ නම්, වෙනත් කවර හෝ අමාත්‍යාංශයක් මගින් ක්‍රියාත්මක කරන එවැනි ව්‍යාපෘතියක් තිබේද;

(iii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ක්‍රීඩා පාසල් කවරේද;

(v) අදාළ පාසල් තෝරාගැනීමේ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0182/'09

3.

ගරු පේමසිරි මානගේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මිහින් එයාර් ගුවන් සමාගම පිහිටවනු ලැබුවේ කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මිහින් එයාර් ගුවන් සමාගමේ සභාපතිවරයාගේ නම, ලිපිනය සහ ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සභාපතිවරයා එම තනතුරට පත්කරනු ලැබුවේ කවරෙකු විසින්ද;

(ii) ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0282/'09

4.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජපන් විදේශ ආර්ථික සේවා අරමුදල මගින් රු. 256,914,765/- ක් වැය කර දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ලෙස ආරම්භ කරන ලද අඹේපුස්ස - ගල්වල ව්‍යාපෘතියේ යන්ත්‍ර සූත්‍ර ක්‍රියාවිරහිත වීම නිසා 2007 වර්ෂයේ දින 253 ක් නිෂ්පාදන කටයුතු නතරවී තිබූ බවත්;

(ii) ඒ අනුව, 2007 වර්ෂයේ නිෂ්පාදන ඉලක්කයන් සපුරා ගෙන ඇත්තේ 34% ක ප්‍රමාණයක් බවත්;

(iii) එම නිසා රු. 33,808,358/- ක් වටිනා ගල් බාහිර සැපයුම්කරුවන්ගෙන් මිල දී ගැනීමට කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත තත්ත්වයන් යටතේ ද අදාළ ව්‍යාපෘතිය මගින් 2007 වර්ෂයේ අතිකාල හා ගමන් වියදම් ලෙස රු. 4,457,356/- ක් ගෙවා ඇති බවත්;

(ii) ඒ අනුව, නිෂ්පාදන ධාරිතාවය හා අතිකාල ගෙවීම් පිළිබඳව පරස්පරයක් ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0367/'09

5.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත අරණායක විවිධ සේවා සමූපකාර සමිතියේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 වසරේ ඡන්දයෙන් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ සම්පූර්ණ නම්, පෞද්ගලික ලිපිනයන්, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iv) දැනට මෙම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර සඳහා සහභාගී වන අධ්‍යක්ෂ මණ්ඩලයේ සංඛ්‍යාව කොපමණද;

(v) එක් අධ්‍යක්ෂවරයෙක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අඛණ්ඩව සහභාගී නොවන්නේ කවර හේතු නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0382/'09

6.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රජය/ශ්‍රී ලංකා මහ බැංකුව පසුගිය අවුරුදු 2 තුළ පෞද්ගලික බැංකුවලින් ණය මුදල් ලබාගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ණය මුදල් ලබාගත් බැංකු හා ලබාගත් ණය මුදල කොපමණද;

(ii) එම ණය මුදල් සහ අදාළ පොළිය ගෙවිය යුතු කාලසීමාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මුදල් පාලනය තිබෙන්නේ පාර්ලිමේන්තුවට බැවින් ඉහත පෞද්ගලික බැංකුවලින් එම ණය මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනුමතිය ලබාගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) එසේ නොවන්නේනම්, ඉහත ණය ලබාගැනීම තුළින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0528/'09

7.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසල්වල සේවය කළ ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සේවයට බඳවා ගැනීමේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ගය කවරේද;

(ii) ගුරු සේවා ව්‍යවස්ථාව යටතේ එකම සුදුසුකම් සපුරා ඇති ස්වේච්ඡා ගුරුවරුන්ට පළාත් දෙකක දී පත්වීම් වර්ග දෙකක් ලබාදුන්නේ කෙසේද;

(iii) එය නිවැරදි කිරීමට ගනුලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුරු සහායකයින් ගුරු සේවයට ඇතුළත් නොකොට ගුරු පුහුණුව සඳහා රජයේ ගුරු විද්‍යාලවලට ඇතුළත්කර අධ්‍යයන කටයුතු ලබාදෙන්නේ කෙසේද;

(ii) ගුරු සහායකයින් සඳහා ලබාදෙන රු. 3000/= දීමනාව ගුරු විද්‍යාල අධ්‍යයන කටයුතු සඳහා ප්‍රමාණවත්වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0073/'09

8.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 1948 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා සහ 2000 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වාත්, වෙන් වෙන් වශයෙන් 2006, 2007, 2008 හා 2009 වර්ෂවලත් පාර්ලිමේන්තුව විසින් නියම කරන ලද උපරිම ණය ගැනීමේ සීමාවන් කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත දක්වන ලද කාලපරිච්ඡේදයන්හිදී දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ණයට ගනු ලැබූ මුදල් ප්‍රමාණයන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2005 සිට 2009 දක්වා කාලය තුළ අතිරේක වියදම් පියවා ගනු පිණිස උපයා ගනු ලැබූ රජයේ ආදායමද වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0218/'09

9.

ගරු ජේමසිරි මානගේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 ජනවාරි මාසය තුළදී ඉන්දීය විදේශ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවට පැමිණියේද;

(ii) එසේනම්, ඒ කවර දිනයකදී ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉන්දීය විදේශ අමාත්‍යවරයා එසේ පැමිණියේ ශ්‍රී ලංකා රජයේ ආරාධනයක් අනුවද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉන්දීය විදේශ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවට පැමිණ සාකච්ඡා පැවැත්වූ පාර්ශ්වයන් හා ඔවුන්ගේ නම් කවරේද;

(ii) ඒ කවර දිනවලදී ද;

(iii) ඉන්දීය විදේශ අමාත්‍යවරයා සාකච්ඡා කළ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0283/'09

10.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 ජූලි 14 දිනැති අංක 11/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, පුද්ගලික කටයුතු සඳහා නිල වාහන පාවිච්චි කිරීමට හිමිකම් නැති දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 16 දෙනෙකු, 2007 වාර්තාවලට අනුව වාහන පාවිච්චි කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන් කවුරුන්ද;

(ii) පාවිච්චි කරන වාහන සහ අදාළ ලියාපදිංචි අංක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0368/'09

11.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සීමාසහිත අරණායක විවිධ සේවා සමූපකාර සමිතියේ පරිපාලන දුර්වලතා හේතුවෙන් 2008 වර්ෂයේ සිට එය සමූපකාර සංවර්ධන කොමසාරිස් පාලනය යටතට ගෙන ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමූපකාර සංවර්ධන කොමසාරිස් පාලනයෙන් නැවත අරණායක විවිධ සේවා සමූපකාර සමිතිය ඉවත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයා පාලනය කරන සමයේ සමූපකාර සමිතිය ලාභ ලැබූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) සමූපකාර සංවර්ධන කොමසාරිස් පාලනයෙන් අරණායක විවිධ සේවා සමූපකාර සමිතිය ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0509/'09

12.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ අවතැන් වූ ජනගහනය කොපමණද;

(ii) ඔවුන් දැනට සිටින කඳවුරු කවරේද;

(iii) එක් එක් කඳවුරේ සිටින සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය කාලය තුළ නැවත පදිංචි කළ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර ප්‍රදේශවලද;

(iii) එලෙස පදිංචි කරනු ලැබුවේ මූලික අවශ්‍යතා හා යටිතල පහසුකම් සපයාදීමෙන් පසුවද;

(iv) නැවත පදිංචි කිරීමේ කඩිනම් වැඩ පිළිවෙළක් සකස්කර තිබේද;

(v) ඒ සඳහා රටේ ජනතාවගේ සහාය ලබාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0074/'09

13.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2000 සිට 2009 වර්ෂය දක්වා කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) දළ දේශීය නිෂ්පාදිතය සහ වර්ධන වේගය කොපමණද;

(ii) මුළු ණය සහ ඒක පුද්ගල ණය කොපමණද;

(iii) ශ්‍රම බලකාය සහ උද්ධමන අගයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0219/'09

14.

ගරු ජේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට ගෙන්වා තිබෙන දුම්රිය මැදිරි හා භෝජනාගාර රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය මැදිරි හා භෝජනාගාර රථ මෙරටට ගෙන්වූ දිනයන් සහ මෙතෙක් භාවිතයට නොගෙන තිබෙන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ මූල්‍ය වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*11.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*12.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*14.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*18.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/-<br>රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*26.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*27.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

28.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

වාරියපොල රාජමහා විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

සෙරෙන්ඩිබ් අධ්‍යාපනික භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

ඉදිරි ලෝකය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.